# හලාවත වැවිලි සමාගම

(වැවිලි අමාත්‍යාංශය/ පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

## ව්‍යාපාරික ස්ථාන සැලසුම් ඇඳීම, ඇස්තමේන්තු සකස් කිරීම, වැඩ බිම් අධීක්ෂණය, මිනුම්පත්‍ර සහතික කිරීම සහ ඒවා ගෙවීම සඳහා නිර්දේශ කිරීම ආදී කටයුතු සඳහා රජයේ විශ්‍රාමික සිවිල් (ගොඩනැගිලි) තාක්ෂණ නිලධාරීන්ගේ සේවය ලබාගැනීම.

අප ආයතනයේ පහත සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය සහිත, වැඩබිම්වලට යෑම සඳහා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සපයා ගත හැකි, රජයේ විශ්‍රාමික සිවිල් (ගොඩනැගිලි) තාක්ෂණ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- තනි තට්ටුවේ ව්‍යාපාරික ගොඩනැගිලි සැලසුම්කර සැලසුම් පිටපත් 3 කින් ඉදිරිපත් කිරීම – බිම් ප්‍රමාණයේ වර්ග අඩියකට ගාස්තුව රු.
- තට්ටුව එකකට වඩා ඇති ව්‍යාපාරික ගොඩනැගිලි සැලසුම්කර සැලසුම් පිටපත් 3 කින් ඉදිරිපත් කිරීම – බිම් ප්‍රමාණයේ වර්ග අඩියකට ගාස්තුව රු.
- වියදම් ඇස්තමේන්තු සැකසීම – වටිනාකම රුපියල් ලක්ෂයක් සඳහා ගාස්තුව රු.
- වැඩ බිම් අධීක්ෂණය – එක් වරකට ගාස්තුව රු.
- වැඩබිම් අධීක්ෂණය සඳහා ප්‍රවාහන වියදම් – කිලෝ මීටරයකට ගාස්තුව (යෑමට සහ ආපසු ඒමට) රු.
- මිනුම්පත්‍ර සකස්කර ඒවා ගෙවීම් සඳහා නිර්දේශ කිරීමට ගාස්තුව – වටිනාකම රුපියල් ලක්ෂයකට රු.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන පුත්තලම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය සහිත අයවලුන් පමණක් තම තම, ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය, දුරකථන අංකය, වට්ස්ඇප් අංකය, ඊමේල් ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, සේවය කළ රාජ්‍ය දෙපාර්තමේන්තු (අවසන් වරට සේවය කළ ස්ථානය මුලින්ම), සේවා කාලය, පළපුරුද්ද සහ විශ්‍රාම ගිය දිනය සහ ඉහත දී ඇති කාර්යයන් සඳහා තම මිල ගණන් වෙන වෙනම සඳහන් කර තමන් විසින් සකසාගත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල ඡායා පිටපත් ද සමග 2021.02.03 දින හෝ ඊට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ගොඩනැගිලි සැලසුම් සඳහා මිල ගණන්"** ලෙස සඳහන් කළ යුතුය. තෝරාගන්නා අයදුම්කරුවන්ට පමණක් ඒ බව දන්වා එවනු ලැබේ. බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, සියලු කාරණාවලදී හලාවත වැවිලි සමාගමේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී,**
**හලාවත වැවිලි සමාගම,**
**165, පුත්තලම පාර,**
**හලාවත. 61000.**